# නිවාඩු ප්‍රතිපත්ති

යුධ හමුදාව පුද්ගලයින්ට නිවාඩු දීම පාලනය වන්නේ 1957 යුහ නිවාඩු හා නිවාඩු දුම්රිය බලපත් රෙගුලාසි මගිනි. මෙය විටින් විට සංශෝධනය විය හැකි අතර, යමෙකුට නිවාඩුව අයිතිවාසිකමක් නොවේ. එය අනිගේ අභිමතය පරිදි සිදුවේ.

ඒකකය තුළ නිවාඩු අනුමත කිරීමේ ප්‍රතිශතය යුහමු හා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ තීරණය මත සිදුවේ.

නිවාඩු වර්ෂය යනු ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලසීමාව වේ. අනුමත නිවාඩු ඉල්ලුම්පත් (පොදු 125) කාර්යාලයේ ගොනුකර තැබිය යුතුයි.

සෑම මුදල් වර්ෂයක් තුළම නිවාඩුව පිළිබඳ වාර්ථාවන් සෑම ඒකකයක් තුළම තිබිය යුතු අතර, එහි නිවාඩු කුමන වර්ගයට අයත් දැයි පැහැදිලිව තිබිය යුතුයි.

**<u>නිවාඩු වර්ග:</u>**

1. විවේක නිවාඩු
2. අනියම් නිවාඩු
3. කෙටි නිවාඩු
4. වෛද්‍ය නිවාඩු
5. විදේශයකට යාමට පෙර හා විදේශයක සිට පැමිණි පසු නිවාඩු
6. සේවය දීර්ඝ කිරීමේ හා නැවත බැඳීමේ නිවාඩු
7. ලාංකාවෙන් බැහැර නිවාඩු
8. රජයේ නිවාඩු
9. අනිවාර්යය නිවාඩු
10. ක්‍රීඩා නියෝජන නිවාඩු
11. හමුදා පාඨමාලා හදාරන ශිෂ්‍යයන් සඳහා හිමි නිවාඩු
12. ප්‍රසූත නිවාඩු

**<u>විවේක නිවාඩු:</u>**

වර්ෂයකට නිවාඩු 28 කි. අවුරුදු 02ක් ඇතුලත ලබා නොගත් විවේක නිවාඩු එකතු කර 03වන අවුරුද්දේ ලබාගත හැකිය. එම නිවාඩු දිවයිනේ ගත කිරීමට නම් දින 42 ක්ද, විදේශගත වීමට නම් දින 56 ක් ලැබේ.

විශ්‍රාම යාමට නියමිත හෝ එසේ අයදුම් කර ඇති සාමාජිකයෙකුට එදින ප්‍රථමයෙන් ලබානොගත් නිවාඩු ඉල්ලා සිටිය හැකි අතර, ඊට පෙර වර්ෂ 02 තුළ ලබා නොගත් නිවාඩුටද ඊට ඇතුලත් වේ.

**<u>අනියම් නිවාඩු:</u>**

වර්ෂයකට දින 17ක් හිමිවේ. එක් වරකට අනුමත කල හැක්කේ දින 04 ක් වේ. මෙම නිවාඩු විවේක නිවාඩු සමඟ සම්බන්ධ කර ලබාගත නොහැක. මෙම නිවාඩු අවුරුද්දක් තුළ අහෝසි වේ.

**<u>කෙටි නිවාඩු:</u>**

සම්පූර්ණ වැටුප් හා දීමනා සහිතව අනුමත කල හැක. සති අන්තයේදී හෝ සානුකම්පිත හේතූන් මත ඕනෑම අවස්ථාවකදී පැය 48 ක කාලයක් අනුමත කල හැක. සති අන්තය යනු

සෙනසුරාදා 0900 සිට සඳුදා 0900 පැය වේ. කෙටි නිවාඩුවක් අනුමත වූ පසු සිකුරාදා දින රාජකාරියෙන් පසු කඳවුරෙන් බැහැර විය හැක. නැතිනම් එම නිවාඩු ආරම්භ වීමට නියමිත දිනට ප්‍රථම දිනයේ (සිකුරාදා) සානුකම්පිත හේතූන් මත කඳවුරෙන් බැහැර වීමට හැක.

රජයේ නිවාඩු දිනයක් සමග කෙටි නිවාඩු අනුමත කල හැකි නමුත් අනියම් හෝ විවේක නිවාඩු සමග අනුමත කල නොහැක.

<u>**වෛද්‍ය නිවාඩු:**</u>

නිර්දේශ කල හැක්කේ රෝහලින් බැහැරව යන හා බෝවන රෝග සඳහා ඇතුලත් නොවන සෙනින් සඳහා පමණි. මෙම නිවාඩු දිය යුතු ක්‍රම සහ උපදෙස් පහත සඳහන් පරිදි වේ.

අ. යුහ වෛද්‍ය වරයෙකුගේ නිර්දේශය මත දින 07 යි.

ආ. අනි යුහ රෝහල/නිඅ මූලික රෝහල විසින් දින 07 ට වැඩි සහ දින 14 ට අඩු කාලය.

ඇ. යුහ වෛද්‍ය සේවා අධ්‍යක්ෂක විසින් දින 14 - 30 අතර කාලය.

ඈ. යුධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂක විසින් පත්කරන ලද මණ්ඩලයකින් දින 30 සිට 90 දක්වා.

ඉ. දින 90 ඉක්මවා වෛද්‍ය නිවාඩුවක් නිර්දේශ කරන්නේ නම් යුධ හමුදාපතිගේ අනුමැතිය ලබාගත යුතුයි.

ඊ. ආයුර්වේද හා සාමාන්‍ය වෛද්‍යවරුන් විසින් අනුමත වෛද්‍ය නිවාඩු අනුමත කිරීම/නොකිරීම සම්බන්ධයෙන් වෛද්‍ය සේවා අධ්‍යක්ෂක විසින් තීරණය කරනු ලබයි.

උ. යුධ හමුදා හෝ රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ගන්නා හෝ අසනීපව නිවස තුළ රඳවන කාලසීමාව මොනයම් හෝ නිවාඩුවක් ලෙස නොසලකන අතර, එය රාජකාරි කාලසීමාවක් ලෙස ගණනය කෙරේ.

ඌ. වෛද්‍ය මණ්ඩලය/වෛද්‍ය වරයා නිර්දේශ කරන වෛද්‍ය නිවාඩු ඒකකයේ අනිගේ හෝ දෙවන අණදෙන නිළධාරි විසින් අනුමත කළ යුතුයි.

<u>**විදේශයකට යාමට පෙර හා විදේශයකින් පැමිණි පසු හිමි නිවාඩු:**</u>

යුධ හමුදා සාමාජිකයෙකුට පුහුණුවක් සඳහා විදේශ රටකට යාමට පෙර හෝ පැමිණි පසු දින 07ක නිවාඩුවක් අනුමත කල හැක. මෙය පුහුණුවීම් කාලසීමාව මාස 06 කට නොඅඩු වන්නේ නම් පමණි.

<u>**සේවය දීර්ඝ කිරීමේ නිවාඩු හෝ නැවත බඳවා ගැනීමේ නිවාඩු:**</u>

සේවය දීර්ඝ කිරීමේදී හෝ නැවත බඳවා ගැනීමේදී සෙබළෙකුට දින 28 ක් අනුමත කල හැක. සේවය දීර්ඝ කිරීමේ හෝ නැවත බඳවා ගැනීමේ නියමිත කාලසීමාවට අඩු නම් නිවාඩු දිය හැක්කේ අනුපාත පදනමක් මතය. සෙබළෙකුගේ සේවා කාලය අවසානයේ මෙම නිවාඩු දින 28 ලබාදීමට අනිවාර්යය නොවේ.

<u>**ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ නිවාඩු:**</u>

ස්ථිර ස්වේච්ඡා බළසේනාවේ නිළධාරි/සෙසුනිළ හට ශ්‍රී ලංකාවෙන් පිට නිවාඩු ගත කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය. එම නිවාඩු ඉල්ලුම් කිරීම සඳහා පොදු 126 ආකෘතිපත්‍රය දින 14කට ප්‍රථම නිළධාරියෙකු නම් යුසේලේඛා වෙත සහ සෙසුනිළයෙකු නම් පිපඅම වෙත ඉදිරිපත් කල යුතුය. සක්‍රීය සේවයට කැඳවා නොමැති ස්වේච්ඡා බළසේනාවේ සාමාජිකයින් සඳහාද රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය.

<u>**රජයේ නිවාඩු:**</u>

අංක 29 දරණ නිවාඩු ආඥාපනතේ 2 (ඒ) වගන්තිය යටතේ පෝය දිනයන් හා ඉරිදා දිනයන් රජයේ නිවාඩු දිනයන් වන අතර, 5 (බී) වගන්තිය යටතේ අනෙකුත් නිවාඩු දිනයන්ද බවට පත්වේ.

යුධ හමුදාව අත්‍යවශ්‍යය සේවාවක් බැවින් රජයේ සෑම නිවාඩු දිනයක්ම නිවාඩු දින ලෙස සැලකිය නොහැක. ඒ නිසා රජයේ නිවාඩු දිනයන්හිද යම්කිසි ප්‍රමාණයක් රාජකාරින්හි යෙදේ. ඒකක අනි වෙත පැවරී ඇති බලතල අනුව පහත දක්වා ඇති අයුරු රජයේ නිවාඩු දිනයන්හිදී නිවාඩු ලබාදිය හැක.

අ. රාජකාරියට අවශ්‍ය නොවන පුද්ගලයෙකු සඳහා

ආ. රජයේ නිවාඩු දිනයන් තම නිවාඩු ආරම්භ වන දිනට පෙර හෝ නිවාඩු අවසන් වූ වහාම නිවාඩු මැදදී යෙදුනහොත් එම නිවාඩු දින තමන් හට හිමිව ඇති නිවාඩුවලින් අඩු නොවනු ඇත. නිවාඩු අනුමත කරන නිළධාරි විසින් මෙය අයදුම්පතේ සඳහන් කළ යුතුය.

පහත සඳහන් කරුණු හේතුවෙන් නිවාඩු ලබාදෙන අවස්ථාවන්හිදී රජයේ නිවාඩු තම නිවාඩු වලින් අඩුවනවා ඇත. මෙම නිවාඩු ලබාදීමේදී රජයේ නිවාඩුද ඇතුලත්ව ගණනය කරනු ලබයි.

අ. එකතු වූ විවේක නිවාඩු.
ආ. වෛද්‍ය නිවාඩු
ඇ. සේවය දීර්ඝ කිරීමේ හා නැවත බඳවා ගැනීමේ නිවාඩු
ඈ. විදේශයකට යාම හා විදේශයක සිට පැමිණි පසු හිමි නිවාඩු
ඉ. අර්ධ වැටුප් ප්‍රසූත නිවාඩු
ඊ. වැටුප් රහිත ප්‍රසූත නිවාඩු

<u>**අනිවාර්යය නිවාඩු:**</u>

යුධ හමුදාවේ හෝ මහජනයාගේ යහපත සඳහා යුධ හමුදා සාමාජිකයෙකු සම්පූර්ණ වැටුප් සහිත, අර්ධ වැටුප් සහිත හෝ වැටුප් රහිතව අනිවාර්යය නිවාඩු යැවීමේ හැකියාව යුධ හමුදාපති සතුව ඇත.

<u>**ක්‍රීඩා නියෝජන නිවාඩු:**</u>

යුධ හමුදා සාමාජිකයෙකු මෙරට හෝ පිට රටකදී ක්‍රීඩාවක් සඳහා ලංකාව නියෝජනය කරයි නම් තෝරා ගත් කාලසීමාවක් සඳහා සම්පූර්ණ වැටුප් සහිතව නිවාඩු දීමට යුධ හමුදාපතිට හැකියාව ඇත.

<u>**හමුදා පුහුණුවීම් පාඨමාලා හදාරන ශිෂ්‍යයන් සඳහා නිවාඩු:**</u>

පුහුණුවීම් පාඨමාලා හදාරන සිසුන්ට එම කාලසීමාව තුළ නිවාඩු අනුමත නොකරන නමුත්, සානුකම්පිත හේතූන් මත සේනාවිධායක හෝ අනි විසින් නිවාඩු අනුමත කල හැක.

<u>**ප්‍රසූත නිවාඩු:**</u>

මේ හා සම්බන්ධව මෙතෙක් පැවති නිවාඩු පිළිවෙත හවනි 02/2005 මගින් සංශෝධනය කර ඇත. ඒ අනුව යුධ හමුදා හා ස්වේච්ඡා බළසේනාවන්හි නිළධාරිනියන් හා සෙබළියන්ට සෑම සජීවි දරු උපතක් සඳහාම මූලිකවම වැටුප් සහිත දින 84 ක නිවාඩුවක්ද, ඉන් අනතුරුව අඩ වැටුප් සහිත දින 84 ක්ද, ඊටත් අමතරව වැටුප් රහිත දින 84 ක්ද, ප්‍රසූත නිවාඩු කාලය තුළට වැටෙන සෙනසුරාදා ඉරිදා දිනයන් හා රජයේ නිවාඩු ඊට ඇතුලත් නොකල යුතු අතර, අඩ වැටුප් සහිත දින 84ක්, ප්‍රසූත නිවාඩු ලබාදීමේ හා වැටුප් රහිත දින 84 ක ප්‍රසූත නිවාඩු

ලබාදීමේදී එම කාලයන් තුළ සෙනසුරාදා, ඉරිදා දිනයන් සහ අනෙකුත් රජයේ සෑම නිවාඩු දිනයන් ඇතුලත්ව එම නිවාඩු ලබාදිය යුතුවේ.

උපතේදීම මරණය සිදුවන දරු උපත් සඳහා සති 06 ට පෙර දරුවා මරණයට පත්වන අවස්ථාවලදී මරණ සහිතකය හෝ වෛද්‍ය සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු විශේෂ වැටුප් සහිත නිවාඩු වශයෙන් දරු උපත සිදුවූ දින සිට සති 06 ක කාලසීමාවක් නිවාඩු ලබාගැනීමේ හිමිකම ඇත. එමෙන්ම දරු ප්‍රසූතියෙන් සති 04ක් යාමට පෙර නැවත සේවයට වාර්ථා කිරීමට ඉඩ ලබා නොදේ. ප්‍රසූත නිවාඩු ලබාගැනීම සඳහා වෛද්‍ය සහතිකය හෝ දරුවාගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කල යුතුවේ.

වැටුප් සහිත ප්‍රසූත නිවාඩු අවසානයේ අඩ වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබා නොගන්නේ නම් දරුවාට මව්කිරි දීම සඳහා සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටත්ව යන වේලාවට පැයකට කලින් පිටත්ව යාමට ඔවුනට අවසර දිය යුතුවේ. මෙම අවසර ලබාදිය යුත්තේ දරුවාට මාස 06 ක් ගතවන තුරු පමණි.

මෙම අනුග්‍රහය ලබාදෙනු ලබන්නේ ප්‍රසූත නිවාඩු ලබාගන්නා තෙක් පමණි. එමෙන්ම ගබ්සා වීමක් හේතුකොට ගෙන අවශ්‍ය නිවාඩු වෛද්‍ය සහතිකයක් මත නිළධාරිනියකට/ සෙබළියකට හිමි විවේක නිවාඩු වලින් ලබාගත හැක.